# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2103/21 - 2018 දෙසැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2018.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ මාවතගම ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මාවතගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ මාවතගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ වෙත්තිගේ උපුල් ප්‍රියන්ත පෙරේරා අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම මාවතගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ෆාරුක් මුවාද් ෆාරුක් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාවතගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ගමලත්ගේ දිලිප් නිශාන්ත වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ෆාරුක් මුවාද් ෆාරුක්, මාවතගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ගමලත්ගේ දිලිප් නිශාන්ත,
තේරීම්භාර නිලධාරී,
මාවතගම ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

01 - 227

1A - G 29155 — 17 (2018/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*